# 2015 අවසාන වාර පරීක්ෂණය 11 ශ්‍රේණිය බුද්ධ ධර්මය පිළිතුරු පත්‍රය

**I** - කොටස (1 x 40 = 40)

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 02 | 2 | 03 | 1 | 04 | 4 | 05 | 2 | 06 | 1 | 07 | 2 | 08 | 1 |
| 09 | 4 | 10 | 1 | 11 | 2 | 12 | 3 | 13 | 4 | 14 | 2 | 15 | 4 | 16 | 2 |
| 17 | 3 | 18 | 2 | 19 | 1 | 20 | 2 | 21 | 3 | 22 | 4 | 23 | 3 | 24 | 4 |
| 25 | 1 | 26 | 2 | 27 | 2 | 28 | 2 | 29 | 3 | 30 | 4 | 31 | 3 | 32 | 1 |
| 33 | 3 | 34 | 4 | 35 | 3 | 36 | 1 | 37 | 2 | 38 | 1 | 39 | 3 | 40 | 4 |

**II** - කොටස

**පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරාගත් අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**
**((1) - ලකුණු 02 (2) - ලකුණු 03 (3) - ලකුණු 05 වශයෙනි.)**

01 (1) අනේපිඩු සිටුතුමා, විශාඛා මහා උපාසිකාව

(2) චීවර සිවුරු පිරිකර / පිණ්ඩපාත දානය, ආහාරපාන / සේනාසන සෙනසුන්, ඉඳුම්හිටුම් / ගිලාන පච්චය ගිලන්පස, බෙහෙත්

(3) පටිච්ච සමුප්පාදය / බෞද්ධ හේතුඵලවාදය

(4) දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාව

(5) ඡන්දය, ද්වේෂය, භය, මෝහය (ඡන්දා, දෝසා, භයා, මෝහා)

(6) අමාවතුර ගුරුළුගෝමී පඬිතුමා (7) සම්මා දිට්ඨි සම්මා සංකප්ප

(8) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

(9) ධර්මානුකූලව ධනය ඉපයීමෙන් ලැබෙන මානසික සතුට / නිවැරදි ජීවිකාවක් ගෙවමියි යන සතුට

(10) ස්තූපයක ආරක්ෂාව සඳහා එය වටකොට තනනු ලබන ගොඩනැගිල්ලයි.

02 (1) පැහැදිලි අරමුණක් තිබීම, නොපසුබස්නා උත්සාහය, කාලයෙන් උපරිම ප්‍රයෝජන ගනිමින් පරාර්ථය නුවෙන් කැපවීම, යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී ගුණය, පරමාදර්ශවත් බව, අටලෝදහමින් කම්පා නොවීම, අන් මතවලට ගරු කිරීම, කාරුණික බව, නිහතමානී ගුණය, සාමකාමී සහජීවන ප්‍රතිපදාව, අසරණ සරණ ගුණය, කළගුණ සැලකීම

(2) බුදුන්වහන්සේගේ චරිතයෙන් එබඳු ආදර්ශයක් ප්‍රකට වූ අවස්ථාවක් කෙටියෙන් පැහැදිලි කර තිබේනම් සම්පූර්ණ ලකුණු දෙන්න.

(3) ශිෂ්‍යයා ලියා ඇති කරුණු දෙකට ඇතුළත්ව සපයා ඇති පිළිතුරට සම්පූර්ණ ලකුණු දෙන්න.

03 (1) සුවසේ නිදීම, සුවසේ පිබිදීම, නපුරු සිහින නොදැකීම, මිනිසුන්ට ප්‍රියවීම, අමනුෂ්‍යයන්ට ප්‍රියවීම, දෙවියන් විසින් රැකීම, ගින්නෙන් විසෙන් හෝ ආයුධ වලින් හානි නොවීම, මුහුණ පැහැපත්වීම, සිත වහා සමාධිගත වීම, සිහිමුළා නොවී කලුරිය කිරීම, මරණින් මතු බ්‍රහ්මලෝකයෙහි ඉපදීම, මින් දෙකක් දැක්වීම ප්‍රමාණවත්ය. (10 ශ්‍රේණිය පෙළ පොතේ පිටු අංක 6 බලන්න.)

(2) ''මවක් තම එකම පුතු දිවිපුදා ආරක්ෂා කරන්නාක් මෙන්'' (මාතා යථා නියං පුත්තං ආයුසා ඒක පුත්ත මනු රක්ඛේ)

(3) මවක් තම එකම පුතු දිවිපුදා ආරක්ෂා කරන්නාක් මෙන් සියලු සත්වයින් කෙරෙහි මෛත්‍රිය වැඩිය යුතුය. එසේ මෛත්‍රී වැඩීම, සිටීම, හිඳීම, ඇවිදීම හා දිගාවී සිටීම යන සෑම ඉරියව්වකදීම කළයුතු බව කරණීයමෙත්ත සූත්‍රයේ දැක්වේ. පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු දෙන්න. (10 ශ්‍රේණිය පෙළ පොත 4248 දක්වා පිටු බලන්න.)

04 (1) බුද්ධරත්නය, ධම්මරත්නය, සංඝරත්නය

(2) ශාරීරික චෛත්‍ය චෛත්‍යය / පාරිභෝගික චෛත්‍යය බෝධිය / උද්දේසික චෛත්‍යය විහාරය

(3) මානසික සහනයක් සැලසීම, මානසික ඒකාග්‍රතාව ඇතිවීම, කලබලකාරී ස්වභාවය මඟහැරීම (පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු විනිශ්චය කරන්න.)

05 (1) දුක්ඛ ආර්‍ය්‍ය සත්‍ය (දුක) / දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍ය (දුකෙහි හේතුව) / දුක්ඛ නිරෝධ ආර්යය සත්‍යය (දුක නැති කිරීම) / දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්යය සත්‍යය (දුක නැතිකිරීමේ මාර්ගය)

(2) ආර්යය අෂ්ටාංගික මාර්ගයයි. අන්තගාමී පිළිවෙත් වලින් බැහැර වීම නිසා මැදුම් පිළිවෙත නම් වේ. මෙම අදහස් ඇතුළත් පිළිතුරකට සම්පූර්ණ ලකුණු දෙන්න.

(3) අංග අටකින් යුත් මැදුම් පිළිවෙත සත්‍යාවබෝධය සඳහා ඒකායන මාර්ගයයි. සදාචාර ජීවිතයක් ගතකිරීමටද ඒවා ඉවහල් වේ. මෙමගින් පුද්ගලයාගේ ලෞකික යහපත සැලසේ. (සිසු පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.)

06 (1) සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝ දපනං ඒතං බුද්ධාන සාසනං

(2) සීල සංවරයෙන් යුක්තව කුසල් උපදවා අර්හත්ඵලයට පැමිණීම / සිතෙහි ඇතිවන අකුසල් සහගත පාප සිතුවිලි දුරුකිරීම / සිත කිළිටි කරන කෙළෙස්වලින් සිත මුදවා ගැනීම

(3) කායික සංවරය යනු ප්‍රාණ ඝාතය, අදත්තා දානය, කාමමිත්‍යාචාරය යන දුසිරිත් වලින් වැළකීමයි. ප්‍රාණඝාතයෙන් වැළකීමෙන් සියලු දෙනාගේ ජීවිත ආරක්ෂා වේ. අදත්තා දානයෙන් දේපල සුරක්ෂිතතාව ඇතිවේ. කාමමිත්‍යාචාරයෙන් වැළකීමෙන් ස්වාමි භාර්යයා දෙදෙනාගේ විශ්වාසනීය ස්ථාවරභාවය තහවුරු වේ. සිසු පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.

07 (1) සණ්ඨාකාර සීනුවක් වැනි / ඝටාකාර කළයක් වැනි / බුබ්බුලාකාර දිය බුබුලක් වැනි / ධාන්‍යාකාර ධාන්‍ය ගොඩක් වැනි / පද්මාකාර පියුමක් වැනි / ආමලාකාර නෙල්ලි ගෙඩියක් වැනි

(2) දුටුගැමුණු රජතුමා, වළගම්බා රජතුමා, මහසෙන් රජතුමා

(3) ධාතු නිධන්කොට දාගැබ්, ස්තූප නිර්මාණය කිරීම / ධර්ම අර්ථයත් ශ්‍රද්ධාවත් ගොඩනැගෙන පරිදි විචිත්‍රවත් ආකෘති ඒ සඳහා භාවිතා කිරීම දාගැබේ ආරක්ෂාවට ''චේතියඝර'' ඉදිකිරීම / චෛත්‍ය පූජාවිධි ඇරඹීම, සර්වඥධාතු ප්‍රදර්ශය, දළදා පෙරහැර පැවැත්වීම (සිසු පිළිතුරු සමස්ථයක් සේ සලකා ලකුණු දෙන්න.)